
එක්සත් ජාතීන්ගේ
ආහාර හා
කෘෂිකර්ම
සංවිධානය

# වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහය යනු කුමක්ද ?



ධීවර හා සාගර සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

# වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහය යනු කුමක්ද?

**එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය**
**රෝමය 2001**

**ධීවර හා සාගර සම්පත් අමාත්‍යාංශය**
නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.

වගකීමෙන් යුත් ධීවර කර්මාන්තයක් සඳහා වූ
පැවතුම් සංග්‍රහය යනු කුමක්ද?

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය

සිංහල පරිවර්තනය - විමලදාස සමරසිංහ

ප්‍රකාශනය - ධීවර හා සාගර සම්පත් අමාත්‍යාංශය

ISBN : 955-9474-01-4

@ ධීවර හා සාගර සම්පත් අමාත්‍යාංශය

# වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහය යනු කුමක්ද?

මත්ස්‍ය සම්පත් නෙලා ගැනීම, සකස් කිරීම සහ අලෙවිය යන කළමනාකරණමය කරුණු ඇතුළත් මුහුදු හා ගොඩබිම් ධීවර කර්මාන්තය ලෝකය පුරා ජනතාවට ආහාර, රැකියා, ආදායම් සහ විනෝදාංශ සපයන වැදගත් මාර්ගයක් වෙයි. දශ ලක්ෂ ගණන් වූ මිනිසුන්ගේ ජීවිකා වෘත්තිය ධීවර කර්මාන්තය මත රඳා පවතී. අනාගත පරම්පරා සඳහා ද ප්‍රමාණවත් මත්ස්‍ය සම්පත් ඉතිරිකර තැබීම අවශ්‍ය වන නිසා ධීවර ක්ෂෙත්‍රයේ නියැලී සිටින හැම දෙනාම තමන් පරිහරණය කරන ධීවර ක්ෂේත්‍රය සංරක්ෂණය කිරීමටත්, ප්‍රවේශමෙන් කළමනාකරණය කිරීමටත් සහාය දීම අවශ්‍යය.

මෙවැනි තත්වයක් සිත්හි තබාගෙන එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 170 කට අධික සාමාජිකත්වය විසින් 1995 දී "වගකීමෙන් යුත් ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහයක්" සකස් කරන ලදී. මෙම පැවතුම් සංග්‍රහය නීතිමය වශයෙන් කිරීමට නියම කරන ලද දෙයකට වඩා, තමන්ගේ කැමැත්තෙන් පිළිපැදිය යුතු පැවතුම් ඇතුලත් ආචාරධර්ම සංග්‍රහයකි. එසේම මෙය මිරිදිය මෙන්ම කරදියද යන භේදයක් නොමැතිව ධීවර හා ජලජීවී අංශවල යෙදී සිටින හා ඒවාට සම්බන්ධව සිටින හැම දෙනාම ඉලක්ක කොට සකස් කෙරුණකි. පැවතුම් සංග්‍රහය ස්වේච්ඡාවෙන් කළ යුතු දේ අඩගුව ඇති සංග්‍රහයක් වන බැවින් ධීවර හා ජලජීවී අංශවල රැකියාවන්හි ජීවනෝපායන්හි යෙදී සිටින සියලු දෙනා එහි අඩංගු මූලික සිද්ධාන්ත වලට හා ඉලක්ක වලට තම තමන්ගේ කැමැත්තෙන්ම කැපවීම අවශ්‍යය. එසේම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික පියවර ගැනීම අවශ්‍යය.

ධීවර කටයුතු වලට අදාල ප්‍රතිපත්ති, ඉලක්ක හා ක්‍රියාත්මක කිරීමේ මූලික අංග යන සියල්ලෙම එකතුවක් වන පැවතුම් සංග්‍රහය සම්පූර්ණයෙන් සවිස්තරාත්මක ලෙස සකස් කිරීම සඳහා වසර දෙකකට වැඩි කාලයක් ගත විය. පැවතුම් සංග්‍රහය සකස් කොට එය ක්‍රියාත්මක කිරීම සඳහා එකගතාවකට පැමිණීම දක්වා වූ එහි සම්පූර්ණ ක්‍රියාවලිය මහත් අපහසුවෙන් සකස් කරන ලද්දකි. ඒ සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සාමාජිකයින්ගේ නියෝජිතයෝ, අන්තර් රාජ්‍ය සංවිධාන, ධීවර කර්මාතයේ නියැලි අය හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයෝ සහභාගි වූහ. මේ

නිසා මෙය ධීවර හා ජලජීවී ක්ෂේත්‍රයේ නියැලී සිටින විවිධ කණ්ඩායම් රාශියක ඒකාබද්ධ ප්‍රයත්නයක ප්‍රතිඵලයකි. මේ අතින් බලන විට මෙම පැවතුම් සංග්‍රහය ධීවර හා ජලජීවී ක්ෂේත්‍රයේ පුළුල් පරාසයක කරුණු පිළිබඳව වූ එකගතාවක් හෝ එසේත් නැත්නම් ගිවිසුමක් වන්නේය.

ඒ ඒ රටවල ධීවර කර්මාන්තය හා ධීවර ප්‍රජාවගේ සහාය ඇතිව හැම රටකටම මෙම පැවතුම් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමක් ඇත. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ කාර්යය වන්නේ එම රටවල ක්‍රියාකාරකම්වලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමය. එහෙත් එම සංවිධානයට එය ක්‍රියාත්මක කිරීම සඳහා සෘජු වගකීමක් නැත. එයට හේතුව ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයට ඒ ඒ රටවල ජාතික ධීවර ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ වගකීමක් නොපැවරෙන හෙයින්ය. ඒ නිසා මෙහි එකම වගකීම්කරු වන්නේ එක් එක් රටවල රජයන්ය.

පැවතුම් සංග්‍රහය වඩාත් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කළ හැකි වන්නේ එහි අඩංගු සිද්ධාන්ත සහ ඉලක්ක ඒ ඒ රටවල ජාතික ධීවර ප්‍රතිපත්ති වලට හා නීතිරීති පද්ධතියට ඇතුලත් කිරීමට හැකි වුවහොත්ය. මේ ප්‍රතිපත්ති හා නෛතික සංශෝධන ඇතිකිරීමට සහාය වීම සහතික කිරීම සඳහා එම සහාය සහ ස්වේච්ඡාවෙන් කෙරෙන ඉදිරිපත් වීම වැඩි දියුණු කිරීම සඳහා ධීවර කර්මාන්තයේ නියැලී හා වෙනත් කණ්ඩායම් විමසීමට රජයන් විසින් පියවර ගත යුතුය. එයට අමතරව ධීවර කර්මාන්තයට වඩාත් යෝග්‍ය හොඳ පුරුදු ගොඩනැගීමට රජයන් විසින් ධීවර ජන කොටස් හා එම කර්මාන්තයේ නියැලී සියලු දෙනා පෙළඹවිය යුතුය. එසේම එම පැවැතුම් සංග්‍රහයේ ඉලක්ක හා අරමුණු වලට ළගාවීමට සහාය දැක්විය යුතුය. මෙසේ ධීවර කර්මාන්තයට අදාල හොඳ පුරුදු ඇති කිරීම, මෙවැනි පැවතුම් සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම උද්යෝගිමත් කිරීමේ තවත් වැදගත් ක්‍රමයකි.

මේ කුඩා පොත් පිංචේ අරමුණ වනුයේ ධීවර කර්මාන්තයට අදාල පැවතුම් සංග්‍රහයේ ඇතැම් වැදගත් අංග තාක්ෂණික නොවන ආකාරයට විස්තර කිරීමයි. ඒ අනුව මේ තොරතුරු මගින් පැවතුම් සංග්‍රහයේ ඉලක්ක හා අරමුණු පිළිබඳව වඩාත් හොඳින් ජනතාව දැණුවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම ඒ මගින් සුළු හා මහා පරිමාණ යන ආදී විශේෂත්වයක් නොමැතිව සියලු ධීවර හා ජලජීවී වගා අංශයන් කෙරේ ක්‍රියාත්මක කිරීමද, ඔවුන් දිරිමත් කිරීමද අපේක්ෂා කෙරේ. මේ කුඩා පොත් පිංච කෙසේවත් ධීවර කර්මාන්තය සඳහා වූ පැවතුම් සංග්‍රහය හෝ ඒ වෙනුවට සකස් කරන ලද වෙනත් ප්‍රකාශනයක් නොව, ඒ පිළිබඳවම සරල ලෙස වැඩි තොරතුරු ප්‍රමාණයක් සපයන්නකි.

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් එම පැවතුම් සංග්‍රහය එහි ප්‍රධාන නිල භාෂා පහටම පරිවර්තනය කරනු ලැබ ඇත. එනම් ආරබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ සහ

ස්පාඤ්ඤ යන භාෂා වලටය. ඊට අමතරව විවිධ රටවල ධීවර කර්මාන්තයේ යෙදී සිටින අය සහ වෙනත් සංවිධාන විසින් ද වෙනත් විවිධ භාෂාවන්ට නිල නොවන මට්ටමින් පරිවර්තනය කර ඇත. ඒ අනුව ඇල්බේනියානු, ක්‍රොඒෂියානු, ඊස්ටෝනියානු, පාර්සි, ජර්මන්, අයිස්ලාන්තික, ඉන්දුනීසියානු, ඉතාලි, ජපාන, පෝලන්ත, රුසියානු, සිංහල, ස්ලෝවේනියානු, ද්‍රවිඩ, තායි සහ ටිග්‍රිනා යන භාෂා වලට එසේ එය පරිවර්තනය කර ඇත. මෙසේ පරිවර්තනය කරනු ලැබ ඇති විවිධ භාෂා මාධ්‍ය වලින් එහි අන්තර්ගතය ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර දෙපාර්තමේන්තුවේ අන්තර්ජාල වෙබ් අඩවියේ ඇතුලත් කර ඇත.

පැවතුම් සංග්‍රහය පිළිබඳව වැඩිමනක් තොරතුරු දැනගැනීමට අවශ්‍ය අය වෙතොත්, ඔවුන්ට ඒවායේ පිටපත් ලබා ගැනීමට ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර දේපාර්තමේන්තුවේ වෙබ් අඩවියට ඇතුල් වන ලෙස ආරාධනා කරනු ලැබේ. එම වෙබ් අඩවියේ ලිපිනය මෙසේය.

http://www.fao.org/fi/agreem/codecond/code con.asp.

අන්තර්ජාල පහසුකම් නොමැති අයට එවැනි පිටපත් ලබා ගැනීම සඳහා

The Chief of Service, FIPL/
Fisheries Department,
Food and Agriculture Organization,
Viale delle, Term d Caracalla 00100,
Italy.

යන ලිපිනයෙන් විමසිය හැකිය. ඔබට අවශ්‍ය පැවතුම් සංග්‍රහය අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ හෝ ස්පාඤ්ඤ යන භාෂා වලින් කුමන භාෂාවේ පිටපතක්ද යන්න විශේෂයෙන් සඳහන් කරන්නට අමතක කරන්න එපා.

## පසුබිම

වර්තමාන සහ අනාගත පරම්පරාවන් සඳහා ප්‍රමාණවත් හා හොඳ මාළු සැපයීම සහතික කිරීම සඳහා ධීවර හා ජලජීවී අංශ වල යෙදී සිටින රටවල් ඇතුලු සියලු දෙනාම මත්ස්‍ය සම්පත් හා ඒවායේ පරිසර පද්ධතීන් සංරක්ෂණය කොට කළමනාකරණය කිරීම සඳහා එකට වැඩ කළ යුතුයැයි පැවතුම් සංග්‍රහය මගින් අවධාරණය කර ඇත. ධීවර ක්ෂේත්‍රයේ නිරතව සිටින සියලුම දෙනා, වර්තමානයේ මෙන්ම අනාගතයේදීත් මත්ස්‍ය සම්පත් සාධාරණ ප්‍රමාණයක් පමණක් නෙලාගැනීම


සහතික කෙරෙන මත්ස්‍ය අස්වැන්න ලබා ගැනීමේ මට්ටමක් පවත්වා ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරිය යුතු වන්නේය. "උපරිම තිරසාර අස්වැන්න ප්‍රමාණය" යනුවෙන් දක්වන්නේද මෙසේ අල්ලා ගනු ලබන මාළු ප්‍රමාණයේ මට්ටමමය. මෙයින් අදහස් වන්නේ රටක කෙරෙන ධීවර මෙහෙයුම් සහ ප්‍රතිපත්ති මත්ස්‍ය සම්පත් දීර්ඝ කාලීනව තිරසාර ලෙස ප්‍රයෝජන අත්කර ගැනීමේ අදහසින් සැලසුම් කළ යුතු බවයි. එය, සම්පත් සංරක්ෂණය නොකඩවා සිදු කෙරෙන, ආහාර සැපයුම සහ ධීවර ප්‍රජාව තුළ දිළිඳුකම පිටුදැකීම අරභයා කෙරෙන්නක් විය යුතුය.

මේ නිසා පැවතුම් සංග්‍රහයේ නියම අරමුණ වන්නේ මෙම ඉලක්කය අත් කර ගැනීම සඳහා තනි තනි  රට වලට සහ රටවල් කණ්ඩායම් වලට ඒවායේ ධීවර හා ජලජීවී වගාවන් වැඩි දියුණු කිරීමට හෝ සංවර්ධනය කිරීමට ආධාර කිරීමය.

වඩාත් හොඳ ධීවර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, දක්ෂතා සහ පළපුරුද්ද අවශ්‍ය වන බව කවුරුත් දන්නා කාරණයකි. එහෙත් සංවර්ධනය වෙමින් පවත්වා රටවලට සහ විශේෂයෙන් අඩුවෙන් සංවර්ධනය වී ඇති රටවලට සහ කුඩා දිවයින් රටවලට හැමවිටම ඒ පහසුකම් නොතිබිය හැකිය. මේ පැවතුම් සංග්‍රහය මගින් ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය වැනි අන්තර් ජාතික සංවිධාන විසින්, එවැනි රටවල ජාතික වශයෙන් නෙලාගන්නා මාළු ප්‍රමාණය වැඩි කර ගැනීමට සහාය වීම උද්‍යෝගිමත් කරනු ලැබේ. ඒ මගින් එම රටවල ධීවර හා ජලජීවී වගා කළමනාකරණ හා සංවර්ධන හැකියාවන් වැඩි දියුණු කිරීම අදහස් කෙරේ.

වගකීමෙන් යුතු ධීවර කළමනාකරණයක් කෙසේ කළ යුතුද යන්න පැවතුම් සංග්‍රහය මගින් විස්තර කරනු ලැබේ. එමෙන්ම ධීවර මෙහෙයුම් කෙසේ සිදු කළ යුතු ද යන්න එහි විස්තර කරනු ලැබේ. ඊළඟට එය ජලජීවී වගා සංවර්ධනය කෙසේ කළ යුතුද යන්න විස්තර කරයි. ධීවර කටයුතු රටේ අනෙකුත් වෙරළ කලාප ක්‍රියාකාරකම් සමග පවත්වා ගත යුතු සම්බන්ධතාව පැහැදිළි කරනු ලැබේ. එසේම නෙලාගනු ලබන මත්ස්‍ය අස්වැන්න අපතේ නොයන ලෙස සකස් කළ යුතු ආකාරය, විකිණීම කළ යුතු ආකාරය පැහැදිලි කරනු ලැබේ. ධීවර ක්ෂේත්‍රයේ සියලු අංශ වල කටයුතු සම්බන්ධයෙන් රටවල් එකිනෙක අතර සහයෝගිතාවේ වැදගත්කම පැවතුම් සංග්‍රහය මගින් මතු කොට ඇත.

ධීවරයින්, කර්මාන්තයේ යෙදී සිටින්නන් සහ රජයන් එම පැවතුම් සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සඳහා කුමන ප්‍රායෝගික පියවර ගත යුතුදැයි පැවතුම් සංග්‍රහය මගින් පැහැදිලි කර නැත. මේ නිසා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය පැවතුම් සංග්‍රහය ක්‍රියාත්මක කිරීමට සහායක් වශයෙන් විවිධ මාතෘකා යටතේ විස්තරාත්මක උපදෙස් මාලාවක් සකස් කරගෙන යයි. මෙම උපදෙස් මාලාවන්හි අරමුණ වන්නේ ධීවරයින්ට, ධීවර කර්මාන්තයේ නියැලි සිටින්නන්ට, ධීවර කළමනාකරුවන්ට පැවතුම් සංග්‍රහයෙන් අදහස් කරනු ලබන කාරණා ඉටුකර ගැනීම සහතික කෙරෙන ලෙස අවශ්‍ය ප්‍රායෝගික සහ තාක්ෂණික උපදෙස් ලබාදීමය.



## ධීවර කළමනාකරණය

පැවතුම් සංග්‍රහය සිය ධීවර කටයුතු කළමනාකරණය සඳහා රටකට පැහැදිලි සහ හොඳින් සංවිධානය වූ ධීවර ප්‍රතිපත්ති තිබිය යුතු බවට මග පෙන්වයි. මේ ධීවර ප්‍රතිපත්ති ධීවර කර්මාන්තයේ යෙදී සිටින්නන්, ඒ හා බැඳුනු වෙනත් අය හා පරිසර කණ්ඩායම් සහ ඒ පිළිබඳ සැලකිල්ලක් දක්වන වෙනත් සංවිධාන ඇතුලු ධීවර ක්ෂේත්‍රය පිළිබඳ සැලකිල්ලක් දක්වන සියලු කණ්ඩායම් වල සහයෝගයෙන් සංවර්ධනය කර ගත යුත්තකි.

මුහුදේ ධීවර සම්පත් රටවල් අතරේ හවුලේ බෙදා ගන්නා දෙයක් වන බැවින් රට රටවල් අතර මත්ස්‍ය සංරක්ෂණය සහ කළමනාකරණය අවශ්‍ය වන අවස්ථා වලදී ධීවර පැවතුම් සංග්‍රහය කලාපීය නව සංවිධාන අලුතෙන් ඇති කිරීමට හෝ පවත්නා එවැනි සංවිධාන වඩාත් ශක්තිමත් කිරීමට මං පාදයි. මේ පොත් පිංචේ මුල් කොටසේ කියැවෙන දීර්ග කාලීන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ඇති එකම ප්‍රායෝගික හා යථාර්ථවාදී ප්‍රවේශය මේ ආකාර වූ සහයෝගීතාවකි. කලාපීය හා අන්තර් ජාතික සහයෝගිතාව සම්බන්ධ කොටසේදී තවදුරටත් කලාපීය ධීවර සංවිධාන වල කාර්යභාරය පිළිබඳව සලකා බලනු ලැබේ.

ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ කර්මාන්ත හැම මට්ටමේදීම පැහැදිලි ධීවර කළමනාකරණ හා නීතිමය රාමුවක් තුළ ක්‍රියාත්මක වීම වැදගත් වේ. ඒ හෙයින් ධීවරමය කර්මාන්ත වල යෙදී සිටින හැම දෙනාටම තමන් අනුගමනය කළ යුතු නීති රෙගුලාසි ගැන පැහැදිලි අවබෝධයක් තිබීම අවශ්‍යය.

ධීවර කටයුතු කළමනාකරනය කළ යුතු වන්නේ ධීවර කර්මාන්තය හා ඒ ආශ්‍රිත ධීවර සැකසුම් කර්මාන්ත අවම පරිසර හානියක් සිදුවන ආකාරයට පවත්වාගෙන යාම සහතික වන පිළිවෙලටය. අපතේ යන ප්‍රමාණය අඩුවන පිළිවෙලටය. එසේම අල්ලාගනු ලබන මසුන්ගේ ප්‍රමිතිය ආරක්ෂා වන ආකාරයටය. ධීවරයින් තම ධීවර මෙහෙයුම් පිළිබඳ වාර්තා තබා ගත යුතුය. රජයන් විසින් ධීවර කටයුතු පිළිබඳව අනුගමනය කළ යුතු පිළිවෙත් ඇතුලු නීතිරීති ක්‍රියාත්මක කළ යුතුය. ඒ මගින් නීති විරෝධී ධීවර කටයුතු කරන අය සොයා ගැනීමටත්, ඔවුන්ට දඬුවම් කිරීමටත් හැකි විය යුතුය. එවැනි බරපතල වැරදි කරන අවස්ථාවලදී දඬුවම් වලට, දඩ ගැසීම් හෝ ධීවර මෙහෙයුම් බලපත්‍ර අවලංගු කිරීම වුවද ඇතුලත් කළ යුතුය.

ධීවර ප්‍රතිපත්ති සකස් කිරීමේදී කාරණා ගණනාවක් සැලකිල්ලට ගැනීම වැදගත් වෙයි. වෙනත් කාරණා සමග, ධීවර කර්මාන්තයේ වැය හා ප්‍රතිලාභ සහ ධීවර කර්මාන්තය පිළිබඳ පාරිසරික මෙන්ම සමාජ බලපෑම යන කරුණු එසේ සැලකිල්ලට ගතයුතු වැදගත් කරුණු වේ.

මෙසේ ධීවර ප්‍රතිපත්ති සකස් කිරීමේදී අදාල අවස්ථා වලදී රටවල් විසින් සාම්ප්‍රදායික ධීවර පුරුදු සහ සාම්ප්‍රදායික දැනුම සැලකිල්ලට ගන්නා අතරතුරම, පවත්නා හොඳම විද්‍යාත්මක තොරතුරුද පාවිච්චි කළ යුතුය. ප්‍රමාණවත් විද්‍යාත්මක තොරතුරු නොමැති අවස්ථාවල රටවල් විසින් කල යුත්තේ මාළු ඇල්ලීමේ සීමා තීරණය කිරීමේදී වඩාත් පරික්ෂාකාරී වීමය.

ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන සියලු දෙනාට සහ සියලු සංවිධාන වලට ධීවර ගැටළු සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් හුවමාරු කර ගැනීමට අනුබල දිය යුතුය. සිය ජීවනෝපාය ධීවර කර්මාන්තයෙන්ම සාදා ගන්නා දේශීය ධීවරයින්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍යය. ධීවරයින් සහ මාළු ඇති කරන්නන් සඳහා අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන් ලබා දීමට රජයන් විසින් මහත් පරිශ්‍රමයක් දැරිය යුතුය. එවිට ඔවුන්ට වර්තමානයේ මෙන්ම අනාගතයේදීද, කල්පවත්නා ලෙස ධීවර කර්මාන්තය පවත්වා ගැනීම සහතික කෙරෙන ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට මැදිහත් විය හැකිය.

මත්ස්‍ය සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා සියලු රජයන් විසින්, ඩයිනමයිට් දැම්ම, වස විස දැම්ම වැනි අනර්ථකාරී හා හානිදායක මාළු ඇල්ලීමේ ක්‍රම සපුරා තහනම් කළ යුතුය.

ධීවර යාත්‍රා වලට මසුන් ඇල්ලීම සඳහා අවසර ඇත්තේ සිය මුහුදු සීමාවන තුළ පමණක් බවට හැම රටක්ම සහතික කළ යුතුය. එම මසුන් ඇල්ලීම කළ යුත්තේ වග කිව යුතු ආකාරයකින් හා රට විසින් පනවා ඇති නීතිරීති, රෙගුලාසි වලට අනුකූලවය. මාළු බිත්තර හා පැටවුන් ඇතුලුව පරිසරය විනාශ වන ආකාරයට මාළු ඇල්ලීමෙන් හා වෙනත් ක්‍රියාකාරකම් කිරීමෙන් වැළකිය යුතුය.

ප්‍රමාණයට වඩා මාළු ඇල්ලීම වළක්වාලීම සඳහා ස්වාභාවික මත්ස්‍ය සැපයුමට නොගැලපෙන ලෙස ධීවර යාත්‍රා සංඛ්‍යාව ප්‍රමාණයට වඩා වැඩි නොකළ යුතුය. ප්‍රමාණයට වඩා මත්ස්‍ය අස්වැන්න නෙලා ගැනීම නිසා අනාගතයේදී මුහුදේ මසුන් ප්‍රමාණය අඩු වී යන්නේය. එයට අමතරව නව ධීවර ආම්පන්න භාවිතයේදී ඒවා භාවිත කිරීමට පෙර ඒවායෙන් පරිසරයට වන බලපෑම (කොරල් පර වලට සිදුවන බලපෑම වැනි) තේරුම් ගත යුතුය. මසුන් අල්ලන ක්‍රමය සහ යොදා ගන්නා ආම්පන්න තෝරාගත යුතු වන්නේත්, ඒවා නිෂ්පාදනය කළ යුතු වන්නේත්, අපතේ යන ප්‍රමාණය අඩුකොට, හසු නොවන මත්ස්‍යයින්ගේ පැවැත්ම ඉහළ මට්ටමක පැවතීමට උදව් වන ආකාරයටය. එසේම ධීවර ආම්පන්න අනවශ්‍ය බලාපොරොත්තු නොවන හා අවශ්‍ය නොවන


මත්ස්‍යයින් හා වැදුවිගෙන යන මත්ස්‍ය වර්ගයන් හසුවීම අවම වන ආකාරයට සකස්වීම හා පාවිච්චි කිරීම ද අවශ්‍යය. අපතේ යන ප්‍රමාණය වැඩි හා අනවශ්‍ය මත්ස්‍ය වර්ගයන් හසුවන ධීවර ආම්පන්න හා ධීවර ක්‍රම ක්‍රමයෙන් ඉවත් කළ යුතුය.

යාත්‍රාවලට කරනු ලබන සැපයුම් වුවද මිලදී ගැනීමේදී අපතේ යන ප්‍රමාණය හා කසල ලෙස ඉවත දමන ප්‍රමාණය අවම වන ලෙස මිලදී ගත යුතුය. යාත්‍රා හිමියන් සහ එහි යන ගැනියන් මුහුදට දමනු ලබන කසලමය ද්‍රව්‍ය වලින් මුහුදු ජලය දූෂණය වීම සිදු නොවීමට වග බලා ගත යුතුය.

වාතයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට ධීවර යාත්‍රාවල එන්ජින් වලින් පිටවන විෂ වායු ප්‍රමාණය අඩු කිරීමටත්, ශීතකරණ පද්ධතිවලින් පිටවන ඕසෝන් නාශක ද්‍රව්‍ය අඩුකිරීමටත් හේතුවන කරුණු ඇතුලත් උපදෙස් රටවල් විසින් හඳුන්වා දිය යුතුය. මෙවැනි ද්‍රව්‍ය පරිසරයට එකතුවීම පියවරෙන් පියවර අඩුකර ගත යුතුය.

තෙත්බිම්, කඩොලාන වනාන්තර, කොරල්පර සහ කලපු වැනි වැදගත් මත්ස්‍ය පරිසරයන් විනාශ කිරීමෙන් සහ දූෂණයෙන් ආරක්ෂා කර ගත යුතුය. ස්වාභාවික ව්‍යසනයන් නිසා මත්ස්‍ය සම්පත් වලට හානි සිදුවන රටවල අවශ්‍ය වූ විටක ක්‍රියාත්මක කිරීම සඳහා හදිසි සංරක්ෂණ හා කළමනාකරණ වැඩ සටහන් සූදානමින් තබා ගත යුතුය.

## ධීවර යාත්‍රා වලට කොඩි නියම කර ඇති රටවල් (ධජ රටවල්)




සිය ජල සීමාවන් ගෙන් එපිට ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රා ඇති රටවලට එම යාත්‍රා සඳහා අවශ්‍ය සහතික නිකුත් කිරීමෙන් පසුව ධීවර කර්මාන්තය කරගෙන යාමට ඉඩදීමේ වගකීමක් ඇත. සිය මුහුදු සීමාවන්ගෙන් එපිට මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන එවැනි ධීවර යාත්‍රා වල විස්තර වාර්තා එම රටවල් විසින් එක් රැස්කර තබාගත යුතුය.

ධීවර යාත්‍රාවකට කොඩියක් (ධජයක්) නිකුත් කරනු ලබන ධජ රටවල් විසින් සිය රටට අයත් යාත්‍රා වල ආරක්ෂා සහිත බව සහතික කරගත යුතුය. එසේම ඒවා රක්ෂණය කර ඇති බව සහතික කරගත යුතුය. රටත් වැඩියෙන් යාත්‍රා සහ දැල් ආම්පන්න ජාතික සහ / හෝ අන්තර්ජාතික නීතිරීති අනුව නිසි ලෙස ලකුණු කර තිබිය යුතුය. එම යාත්‍රා විදේශිකයින් සමග ඇතිවන අනතුරු සම්බන්ධයෙන් වූ තොරතුරු අදාල විදේශිය ආණ්ඩු වෙත සැපයිය යුතුය.

## ධීවර වරායන් ඇති රටවල්
## (වරාය රටවල්)

වගකීමෙන් යුතුව ධීවර කර්මාන්තයේ යෙදෙන බව සහතික කර ගැනීමට සහාය වීම සඳහා හදිසි අවස්ථාවල ධීවර වරාය වල නවතා තබන යාත්‍රා වැනි යාත්‍රා හැර විදේශ ධීවර යාත්‍රා තමන්ගේ ධීවර වරායන්ට ඇතුලු වන අවස්ථාවන්හිදී ඒවා පරීක්ෂා කිරීම වැනි කාරණා සඳහා නිශ්චිත ක්‍රියා මාර්ගයක් එම රටවල් විසින් සකස් කර ගත යුතුය. ධීවර යාත්‍රාව, කොඩියක් නියම කර ඇති රටක ලියාපදිංචි කර ඇති යම් යාත්‍රාවකට විරුද්ධව නීති විරෝධී කටයුතු වල යෙදී ඇතැයි සැක කොට පරීක්ෂණ කටයුතු කරන ලෙස ඉල්ලා සිටින්නේ නම් වරායන් ඇති රටවල් එම රටවල් වලට ඒ සඳහා සහාය දැක්විය යුතුය.

ධීවර වරායන් හා නැංගුරම් පොළවල් ඇතුලු මාළු අස්වැන්න ගොඩබාන ස්ථාන ධීවර යාත්‍රා වලට ආරක්ෂා සහිත ස්ථාන විය යුතුය. මෙවැනි ස්ථානවල යාත්‍රා වල සේවාවන් කිරීමට, වෙළඳාමට සහ මිලදී ගැනීමට පහසුකම් තිබිය යුතුය. පිරිසිදු ජල සැපයුම්, සෞඛ්‍ය පහසුකම් සහ අපවිත්‍ර ද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම ආදිය ද ඒවායේ තිබිය යුතුය.



## ජලජීවී වගා සංවර්ධනය


මූලික ඉලක්කයන් ලෙස ජලජීවී වගා සංවර්ධනයේදී මිනිස් පරිභෝජනය සඳහා මාළු සැපයුම වැඩි කරන ගමන්ම, දේශීය මත්ස්‍ය ජනගහනයට හානි පැමිණෙන ලෙස සහ ඔවුන්ගේ ප්‍රානමය විවිධත්වය ආරක්ෂා වන ආකාරයට එය සිදු කළ යුතුය.

ජලය, කලපු හෝ ගොඩබිම් වැනි සම්පත් නිතර නිතර වැඩි ගණනක් විවිධ පුද්ගලයින් විසින් පරිහණය කරනු ලැබේ. එසේම ඒවා විවිධ පුද්ගලයින්ට භාවිත කිරීමට හැකියාවද ඇත. සම්පත් භාවිත කරන විවිධ පුද්ගලයින් අතර ඇතිවන ගැටුම් හා ආරාවුල් මග හැරීම සඳහා එම සම්පත් සාධාරණ පදනමකින් භාවිත කිරීම හා බෙදාහැරීම සහතික කෙරෙන ප්‍රතිපත්ති සහ සැලසුම් රටවල් විසින් ඇතිකර ගත යුතුය.

ජලජීවී වගා සංවර්ධන වැඩ සටහන්වලින් මත්ස්‍ය බිම්වලට ඇතුල්වීමට ඇති ඉඩකඩ ඇහිරීම, ධීවරයින්ගේ ඵලදායිතාව අඩුවීම වැනි අවාසිදායක ප්‍රථිඵල ප්‍රාදේශීය

ධීවර ප්‍රජාවන්ගේ ජීවිතයට බල නොපාන ලෙස රටවල් විසින් අවශ්‍ය පියවර ගත යුතුය. ජලජීවී වගාවේ පාරසරික බලපෑම් තක්සේරු කෙරෙන සහ මෙහෙයවෙන ක්‍රියා මාර්ග ඇති කළ යුතුය. එයට අමතරව ජලජීවී වගාවන් සඳහා යොදාගනු ලබන කෑම සහ පොහොර වර්ග සොයා බැලෙන මෙහෙයුම් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය. රෝග පාලන බෙහෙත් හා රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කළ යුතුය. මේවා බරපතල ලෙස පරිසරයට හානිකර ලෙස බලපෑ හැකි බැවිනි. ඒ සමගම ජලජීවී වගා නිශ්පාදනවල ප්‍රමිතිය සහ ආරක්ෂාව සහතික කිරීම ඉතා වැදගත්ය.

යම් මත්ස්‍ය වගාවක් තම රටින් එපිට යම් රටක ජල සීමාවන්ට බලපායි නම් එවැනි රටක් දේශීය නොවන මත්ස්‍ය වර්ග මත්ස්‍ය වගාවන් සඳහා හඳුන්වා දෙනු ලබන විට එය සිදුකිරීමට පෙර යාබද රටවල් විමසා කටයුතු කළ යුතුය. අලුත් මත්ස්‍ය වර්ගවලින් ඇතිවිය හැකි ලෙඩ රෝග අවම කර ගැනීම සඳහා අලුතෙන් මත්ස්‍ය වර්ග සහ ජලජ පැලෑටි එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට හඳුන්වාදීමේදී සහ මාරුකිරීමේදී රටවල් විසින් අන්‍යෝන්‍ය වශයෙන් එකගවූ නීති සංග්‍රහයක් ඇති කර ගත යුතුය. ජලජීවී වගා සංවර්ධන වැඩ සටහන් සැලසුම් කිරීමේදී වඳවී යාමේ තර්ජනයට මුහුණ දී සිටින මත්ස්‍ය වර්ගවල සැපයුම වැඩි කිරීමටත්, ඒවා ආරක්ෂා කිරීමටත් පහසුවන තාක්ෂණයන් රටවල් විසින් හා එම කර්මාන්තකරුවන් විසින් සංවර්ධනය කළ යුතුය. එවැනි ප්‍රතිකාර්ය ක්‍රම ක්‍රියාත්මක කරනු නොලැබුවහොත් වඳවී යාමේ තර්ජනයට මුහුණ දී සිටින මත්ස්‍ය වර්ග සම්පූර්ණයෙන්ම වඳ වී යා හැකිය.




## ධීවර කර්මාන්තය, වෙරළ ප්‍රදේශ කළමනාකරණය සමග ඒකාබද්ධ කිරීම

ජලය, ගොඩබිම, වෙරළ වැනි වෙරළ සම්පත් කෙසේ ප්‍රයෝජනයට ගතයුතුද ඒවාට කෙසේ ප්‍රවේශ විය යුතුද යන කරුණු තීරණය කිරීමේදී, එම ප්‍රදේශවල ජීවත්වන ධීවරයින් ඇතුලු ජන කොටස්, ඔවුන්ගේ ජීවන ක්‍රමයන් ආදිය සැලකිල්ලට ගත යුතුය. එවැනි කරුණු සැලසුම් කරන අවස්ථාවලදී ඔවුන්ගේ අදහස්ද සැලකිල්ලට ගත යුතුය.

වෙරළ කලාපයන්හි විවිධ කොටස් විවිධ ප්‍රයෝජනයන් සඳහා භාවිත කරන ස්ථානවල ධීවර මෙහෙයුම් ක්‍රියාත්මක කළ යුත්තේ ධීවරයින් හා වෙනත් අය අතර ඇති

විය හැකි ගැටුම් මග හැරෙන ආකාරයටය. එවැනි ගැටුම් ඇතිවන අවස්ථාවලදී සාධාරණ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් එම ගැටුම් නිරාකරණය කළ යුතුය. එයට අමතරව, එකට යාබදව වෙරළ ප්‍රදේශ ඇති රටවල් එම අනෙක් රටවල් සමග සහයෝගයෙන් කටයුතු කරමින් වෙරළ සම්පත් සංරක්ෂණය කර ගනිමින් ඒවා හොඳින් කළමනාකරණය කිරීම සහතික කළ යුතුය.

## පසු අස්වනු පුරුදු සහ වෙළඳ වගකීම්



රටවල් විසින් සිය රටවැසියනට මාළු කෑම සඳහා අනුබල දිය යුතුය. එසේම මාළු හා වෙනත් මාළු නිෂ්පාදන වල වැඩි ආරක්ෂා සහිත බව සහ සෞඛ්‍ය සම්පන්න බව සහතික කළ යුතුය. මසුන් ගේ හා මත්ස්‍ය නිෂ්පාදන වල ප්‍රමිතිය පවත්වා ගනිමින් පාරිභෝගිකයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීමට අවශ්‍ය වැඩ සටහන් රජයන් විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතුය. වැරදි තොරතුරු ලබාදී පාරිභෝගිකයින් රවටා කුණු මාළු අලෙවි කිරීම වැනි වාණිජමය හොර මැර කම් ඒ මගින් වළක්වා ගත යුතුය. තවදුරටත් රටවල් එකතු වී සහයෝගයෙන් පොදු සනීපාරක්ෂක පියවරයන් හා ඒ වෙනුවෙන් සහතික දීමේ වැඩ සටහන් ඇති කළ යුතුය.

මාළු සකස් කිරීමේ, ප්‍රවාහනය කිරීමේ හා ගබඩා කිරීමේ ක්‍රම පරිසරයට හිතකර විය යුතුය. මේවා පරිසර දූෂණයට හේතු නොවිය යුතුය මාළු අස්වනු ලබාගැනීමෙන් පසුව සිදුවන හානි හා අපතේයාම් අවම කර ගැනීමට පියවර ගත යුතුය. අනවශ්‍ය මාළු ලැබුණු විට ඒවාද හැකි උපරිම ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. මත්ස්‍ය නිෂ්පාදන සකස් කිරීමේදී විශේෂයෙන් යොදා ගන්නා ජලය, බලශක්තිය සහ දැව ප්‍රවේශමෙන් පරිහරණය කළ යුතුය. හැකි හැමවිටම, ඉහළ වටිනාකමක් ඇති මත්ස්‍ය නිෂ්පාදනයන් වැඩි කිරීමට අනුබල දිය යුතුය. ඒ මගින් ධීවරයින්ට වැඩි ආදායම් ලබා ගැනීමට ඇති අවස්ථා වැඩි කළ යුතුය.

මාළු හා මාළු නිෂ්පාදන වලට අදාල වෙළඳ නීති සරල මෙන්ම පැහැදිලි ද විය යුතුය. එමෙන්ම ඒවා ජාත්‍යන්තර නිතිරීති වලටද එකඟ විය යුතුය. රටවල් විසින් වරින් වර ඔවුන්ගේ වෙළඳ නීති රීති ඇති කිරීමේදී සහ සමාලෝචනය කිරීමේදී ධීවරයින්, පරිසර සංවිධාන සහ පාරිභෝගික කණ්ඩායම් වල අදහස්ද ලබාගත යුතුය. එක් රටක නීතිරීති සම්පාදනය කරන විට හෝ වෙනස් කරන විට ඒ බව අනෙක් රටවලටද දන්වා ඒවාට ගැලපෙන ලෙස ඔවුන්ගේ ආනයන හෝ අපනයන ක්‍රියාමාර්ග වලට අවශ්‍ය වෙනස්කම් කිරීමට ඔවුන්ට කාලය ලබාදිය යුතුය.

අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් අල්ලන මාළු තොග මිලදී ගැනීමට අන්තර්ජාතික වෙළඳාම සම්බන්ධ ගෙවීම වැදගත් කාරණයකි. වඳවියාමට මුහුණ දී සිටින මත්ස්‍ය වර්ග වෙළඳම පාලනය කරන අන්තර්ජාතික ගිවිසුම් නිරීක්ෂණය කිරීමේදී එවැනි රටවල් සහයෝගය දක්වති වැඩි මනත් වශයෙන් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වෙළඳම මගින් මත්ස්‍ය සම්පත් ආරක්ෂා කර ගැනීම යන තිරසාර ලෙස ප්‍රයෝජන ගැනීම යටපත් කිරීම නොකළ යුතුය.

## ධීවර පර්යේෂණ

වගකීමෙන් යුත් ධීවර ප්‍රතිපත්තියක් සඳහා හොඳ විද්‍යාත්මක පදනමක් අවශ්‍ය බව සියළු රටවල් විසින් අවබෝධ කොට ගත් යුතුය. මේ නිසා ධීවර කර්මාන්තයේ නියැලි සියළු රටවල් ධීවර කටයුතු වලට අවශ්‍ය පර්යේෂණ සඳහා පහසුකම් ඇතිකර ගතයුතුය. ඒ සමගම තරුණ තාක්ෂණඥයින් පුහුණු කිරීම සඳහා ආධාර හා අනුබල දියයුතුය. තාක්ෂණික හා අන්තර්ජාතික ආයතන ධීවර පර්යේෂණ කටයුතු සඳහා රටවලට උදව් උපකාර කළ යුතුය. එම කාර්යයේදී අඩුවෙන් සංවර්ධනය වූ රටවලත් සංවර්ධනය වෙමින් පවතිනා දිවයින් රටවල් වලත් ·අවශ්‍යතා කෙරෙහි වැඩි අවධානයක් යොමුකරමින් එම ආයතන සිය සේවාවන් ලබාදිය යුතුය.

පර්යේෂණ පැවැත්වීම සඳහා රටවල් විසින් මත්ස්‍ය සම්පත් වල සහ මත්ස්‍ය බිම වල තත්වයන් නිසි ලෙස පවත්වා ගැනීමට එවා මෙහෙය විය යුතු අතර එම තත්වයන්ගේ කිසියම් වෙනස් වීමක් සිදුවන්නේදැයි සොයා බැලිය යුතුය. විවිධ වර්ග වලට අයත් ධීවර ආම්පන්න ඉලක්ක ගත මත්ස්‍ය ජනගහනය කෙරෙහි සහ පොදු පරිසරය කෙරෙහි කෙසේ බලපාන්නේ දැයි සොයා බැලීමට තොරතුරු එක්රැස් කළයුතුය. වානිජ වශයෙන් යම් අලුත් ආම්පන්නයක් හෝ තාක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම සඳහා රටක් සැලසුම් කිරීමේදී මෙවැනි පර්යේෂණ විශේෂයෙන් වැදගත් වෙයි. එවැනි අවස්ථා වලදී සමාජමය හා වානිජමය බලපෑම සොයා බැලිය යුතුය.


අන්තර්ජාතික පර්යේෂණ සඳහා කෙරෙන උත්සාහයන් සඳහා රටවල් එකිනෙක එකතුව් කටයුතු කළ යුතුය.වෙනත් රටකට අයත් මුහුදේ යම් පර්යේෂණ කටයුත්තක් කෙරෙන විට එම රටේ පවත්නා ධීවර නීතිරීති වලට යටත් විය යුතු බව පර්යේෂකයින් දැනගැනීම වැදගත්ය. අලුතෙන් සොයාගන්නා ධීවර හා ඒ ආශ්‍රිත විද්‍යාත්මක තොරතුරු හැකි ඉක්මනින්ම කලාපීය ධීවර සංවිධාන වලට සපයා අවශ්‍ය අනෙකුත් රටවලට බෙදහැරීමට කටයුතු කළ යුතුය.

## කලාපීය හා අන්තර්ජාතික සහයෝගිතාව

ධීවර කර්මාන්තයට අදළ බොහෝ කරුණු සම්බන්ධයෙන් රටවල් හා කලාපීය ධීවර සංවිධාන එකට එක්ව සහයෝගීව කටයුතු කළ බව පැහැදිලි කාරණයකි.එහිලා රක් රටක් විසින් ගනු ලබන කළමනාකරණ පියවර නව අනෙක් රටවල ක්‍රියාත්මක කර

ඇති ඒ හා සමාන පියවර හා ගැලපිය යුතුය. විශේෂයෙන් එකම මත්ස්‍ය බිම්වල විවිධ රටවල ධීවරයින් මාලු අල්ලන විට ඒවා එසේ විය යුතුය. වැඩිමනත් වශයෙන් කලාපීය ආයතන හරහා වන සහයෝගිතාව ඒ ඒ රටවල ධීවරයින් අතර ඇතිවන ගැටුම් අවම කරගැනීමටත් හේතු විය යුතුය. එහෙත් ධීවරයින් අතර ගැටුම් ඇති වූ විට හැකි ඉක්මනින් ඒවා සාමකාමීව සමථයකට පත්කරගැනීමට හැම උත්සාහයක්ම දැරිය යුතුය.

කලාපීය ධීවර සංවිධාන සංරක්ෂණය, කළමනාකරණය සහ පර්යේෂණ සඳහා යන වියදම් එහි සාමාජිකයන් වෙතින් ලබා ගැනීමට ඉලක්ක කර ගත යුතුය. එයට අතිරේකව කලාපීය ධීවර සංවිධාන වල කටයුතු වලදී ප්‍රාදේශීය ධීවර සංවිධාන වල නියෝජිතයින්ටද සහභාගී වීමට අවස්ථාව ලබාදිය යුතුය.



**මේ සියල්ලේම තේරුම කුමක්ද?**


රටවල් වලට දුරදක්නා ප්‍රතිපත්ති හා ඒ හා බැඳුනු වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් අරමුණු කරගත්, මාලු ඇල්ලීමේ පුරුදු ඇත්නම් දිනෙන් දින අලුත්වන ස්වාභාවික සම්පතක් ලෙස අවුරුද්දෙන් අවුරුද්ද මාළු අස්වැන්න එකතු කරගත හැකිය. ඒ හා සමානවම පරිසරයට හානි නොවන මත්ස්‍ය විශාවන් ජලජීවී වගාවන් ලෙස වැඩිදියුණු කළ යුතුය. මේ ආකාරවූ ජලජීවී වගාවන් ඒවා වගාකරන ප්‍රජාවට හා ඔවුන්ගේ රටවල ආර්ථිකයන්ට ඉතා වැදගත් සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ලබාදෙයි. මුහුදු හා ගොඩබිම් ධීවර කර්මාන්තයේ නියැලි සියලු දෙනා විසින්ම "වගකීමෙන් යුත් ධීවර කර්මාන්තයක් සඳහා වූ පැතුම් සංග්‍රහය" සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබන්නේ නම් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වර්තමාන මෙන්ම අනාගත පරම්පරාවන්ටද පරිභෝජනය සඳහා ලබාදෙන බවට බලාපොරොත්තු විය හැකිය. සත්‍ය වශයෙන්ම, තමන් විසින් කරනු ලබන නොසැලකිලිමත් හා අධි භාවිතාමය මාලු ඇල්ලීම් මගින් අනාගත පරම්පරාවන් සඳහා ඇති මාලු සැපයුම අඩු නොකරන බවට වග බලාගැනීමේ වගකීමක් වර්තමාන පරම්පරාවට ඇත.

වගකීමෙන් යුත් ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහය විසින් රටවල් වලින් හා රටවල ජනතාවගෙන් ආයාචනා කර සිටින්නේ ධීවර ක්ෂත්‍රය සඳහා බලපාන සියලු දේ, ඇතුලත් ඒකාබද්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ලෙසයි. එවිට සෞඛ්‍ය සම්පන්න වඩාත් ශක්තිමත් ධීවර අංශයක් ගොඩනැගෙනු ඇත. දීර්ඝ කාලීනව ක්ෂේත්‍රයේ එබදු වගකිව යුතු හැසිරීමක් මගින් මත්ස්‍ය සම්පත් වල ප්‍රමාණයේ මෙන්ම ලෝකයේ ආහාර ආරක්ෂාව සහතික කෙරෙන විශ්වාසනීය දයකත්වයක් හා තිරසාර ආදයම් ඉපයීමේ අවස්ථා ඇතිකළ හැකිය.

වගකිවයුතු ලෙස ධීවර කර්මාන්තයේ යෙදීමට හැකිවන ධීවර පුරුදු ඇති කිරීම සඳහා ලෝකයේ සියලු ජාතීන් එක් වන්නේ නම් අනාගත පරම්පරාවන්ටද ප්‍රමාණවත් ලෙස මාළු සැපයුම කළහැකි තත්වයක් ඇතිවනු ඇත. ඔබට මේ කුඩා පොත් පිංච මගින් සැපයෙන තොරතුරුවලින් ලොව මුහුදු හා ගොඩබිම් ධීවර කර්මාන්තය වගකිව යුතු ආකාරයකට සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීමට යම් දයකත්වයක් ඔබට කළ හැකියැයි ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ධීවර දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

මේ කුඩා පොත් පිංච මගින් වගකීමෙන් යුත් ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහයේ වැදගත් අංශ පිළිබඳ තාක්ෂණික නොවන ආකාරයේ විස්තරයක් ලබා දේ. මෙහි පරමාර්ථය එම පැවතුම් සංග්‍රහයේ අරමුණු හා ඉලක්ක පිළිබඳව හොඳින් දැනුවත් කර මුහුදු හා ගොඩබිම් ධීවර කර්මාන්තය සඳහා එය ඵලදයි ලෙස යොද ගැනීමට පෙළඹවීමය.

මේ පොත් පිංච සම්පූර්ණ පැවතුම් සංග්‍රහය නොවේ. එහෙත් එහි අඩංගු සමහර සංකීර්ණ තොරතුරු සරල ලෙස මෙහි ඉදිරිපත් කර ඇත. මෙය ධීවර ක්ෂේත්‍රයේ නියැලී සිටින සියළු දෙනාට වඩාත් පහසුවෙන් පැවතුම් සංග්‍රහය පිළිබඳ අදහසක් ඇති කර, ඒ මගින් එය අධ්‍යයනය කිරීම සඳහා යොමු කිරීමට ගත් උත්සාහයකි.



මේ කුඩා පොත්පිංච මගින් වගකීමෙන් යුත් ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහයේ සමහර වැදගත් අංශ පිළිබඳව තාක්ෂණික නොවන ආකාරයෙන් කරුණු පැහැදිලි කර දෙයි. මෙහි මූලික පරමාර්ථය වන්නේ පැවතුම් සංග්‍රහය පිළිබඳව සහ එහි අරමුණු සහ ඉලක්ක පිළිබඳව වඩාත් හොඳින් දැනුවත් කිරීමත්, මුහුදු හා මිරිදිය ධීවර කර්මාන්තය සඳහා එහි සඳහන් කරුණු යොදා ගැනීමට උනන්දු කරවීමත්ය.

මෙම කුඩා පොත්පිංච පැවතුම් සංග්‍රහය වෙනුවට සකස් කරන ලද එවැනිම වෙනත් පොතක් හෝ සංග්‍රහයක් නොවේ. එහි සඳහන් සංකීර්ණ තොරතුරු සරලව ඉදිරිපත් කොට ධීවර සම්පත් ප්‍රයෝජනයට ගන්නා අය වැඩි සංඛ්‍යාවකට ඒ පිළිබඳව දැන ගැනීමට අවස්ථාව සැලසීමේ උත්සාහයකි.

ISBN : 955-9474-01-4

Print & Print Graphics (Pvt) Ltd., Colombo 10.